ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

කළමනාකරණ අධ්‍යයනවේදී උපාධි වැඩ සටහන
අන්තර් මධ්‍ය මට්ටම

අවසාන පරීක්ෂණය - 2006

**MCU 2207**- සාර්ව ආර්ථික විද්‍යාව

කාලය පැය තුනයි.

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 08 කින් සහ පිටු 03 කින් යුක්තය.

---

දිනය 2006 පෙබරවාරි 18 වන දින　　　　　　වේලාව - ප.ව. 01.30 - ප.ව.04.30

---

ඕනෑම ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
සියළුම ප්‍රශ්නවලට සමාන ලකුණු ලැබේ.

01. අ. පහත දෑ විස්තර කරන්න.

- **i.** ඉතුරුම් ශ්‍රිතය
- **ii.** ආරෝපනය

(ලකුණු 0

ආ. අංශ හතරේ ආර්ථිකයකට අදාළ විස්තර පහත දී ඇත.

$c = 80 + 0.8\,Yd$ (පරිභෝජනය)
$\bar{I} = 116$ (ආයෝජනය)
$\bar{G} = 140$ (රජයේ වියදම්)
$T = 20 + 0.1\,Y$ (බදු)
$\bar{X} = 80$ (අපනයන)
$M = 20 + 0.1\,Y$ (ආනයන)

**I.** ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 04)

**II.** වියදම් ගුණකය සොයන්න. (ලකුණු 03)

**III.** රජයේ සංකෝචන පිස්කල් ප්‍රතිපත්තිය අනුව රජය රු.බිලියන 10 කින් වියදම් වෙනස් කර ඇත. නව ජාතික ආදායම කවරේ ද? (ලකුණු 0

**IV.** රුපියලේ අගය වැඩි වූවා යැයි අනුමාන කරන්න.
එහි ප්‍රතිඵලයක් ලෙස අපනයන රු.බිලියන 10න් ද ආනයන රු.බිලිය
5 න් ද වෙනස් වී නම් නව ජාතික ආදායම ගණනය කරන්න.

(මුලින්ම දී ඇති දත්තයන් හැම පියවරක් සඳහාම පාවිච්චි කරන්න. ගණනයන් පැහැදිලිව පෙන්වන්න.) (ලකුණු 0

02. අ. පහත සඳහන් දෑ විස්තර කරන්න.

i. මුදල් සංසරණ ප්‍රවේගය

ii. සමපේක්ෂණ චේතනාව සඳහා වූ මුදල් ඉල්ලුම

(ලකුණු 06

ආ. මුදල් සැපයුම සහ මිළ අතර කේන්සියානු පිවිසුම සහ සම්භාව්‍ය පිවිසුම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 14

03. අ. තෙරපුම් ප්‍රතිවිපාකය (**Partial Crowing out effect**) යනු කුමක් ද? (ලකුණු 04

ආ. මුදල් සැපයුම පොලි අනුපාතයෙන් සම්පූර්ණයෙන් ස්වාධීන වූ විට ප්‍රසාරණාත්මක මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්තිවල බලපෑම විස්තර කරන්න (ලකුණු 08

ඇ. පහත සඳහන් දෑ **IS/LM** වක්‍ර ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

i. සාමාන්‍ය මිළ මට්ටම් වැඩිවීම.

ii. අන්තර් බැංකු අනුපාතය මහ බැංකුව විසින් අඩු කිරීම.

iii. විවෘත වෙළඳපොළේ රජයේ සුරකුම් පත් හා බැඳුම්කර විකිණීම.

iv. රජය විසින් බදු අඩු කිරීම. (ලකුණු 08

04. අ. ව්‍යුහාත්මක උද්ධමනය යනු කුමක්ද ? (ලකුණු 05

ආ. උද්ධමනයෙන් ජාතික ආර්ථිකයට වන බලපෑම විග්‍රහ කරන්න. (ලකුණු 1

05. අ. සත්‍යය සේවා වියුක්තිය නිල සේවා වියුක්ති අනුපාතයෙන් විග්‍රහ නොවේ. ඔබ එකඟද පැහැදිලි කරන්න. (ලකුණු 10

ආ. විවිධ සේවා වියුක්ති ක්‍රමයන් අඩු කිරීම සඳහා විවිධ ක්‍රමවේදයන් සඳහන් කරන්න. (ලකුණු 10

06. අ. පිස්කල් ප්‍රතිපත්තිය ආර්ථික ස්ථායිකරනය සඳහා ශක්තිමත් මෙවලමකි. සවිස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 1

ආ. "ගුණක" සංකල්පය පිස්කල් ප්‍රතිපත්තියට සම්බන්ධ වන අයුරු උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 0

07. අ. පටු සහ පුළුල් මුදල් සැපයුම යනු කුමක් ද? (ලකුණු 0

ආ. මුදල් සැපයුමෙහි තීරණාත්මක සාධක කවරේ ද? (ලකුණු 0

ඇ. මූල්‍ය අතරමැදි කාර්යයයේ ඇති වාසි හා ගැටළු කවරේ ද? (ලකුණු 1

08. අ. පූර්ණ සාධක ඵලදායීතාවය යනු කුමක් ද? (ලකුණු 03)

ආ. "ආර්ථික වර්ධනය යනු ආර්ථික සංවර්ධනයයි" පැහැදිලි කරන්න. (ලකුණු 05)

ඇ. ආර්ථික වර්ධනය තීරණය කිරීම කෙරෙහි පහත සඳහන් සාධකවල බලපෑම විග්‍රහ කරන්න.

i. ජනගහන වර්ධනය
ii. ප්‍රාග්ධන ප්‍රමාණය
iii. තාක්ෂණය

(ලකුණු 12)

- හිමිකම් ඇවිරිණි. -